© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019

## PE0120 (PE720) – අධ්‍යාපන න්‍යාය සහ මූලධර්ම

### II කොටස

**"අ"** සහ **"ආ"** යන කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරා ගෙන ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

### "අ" කොටස

01. "අධ්‍යාපනයේ ක්‍රියාකාරී අංශය රඳා පවතින්නේ අධ්‍යාපන දර්ශනය මත ය." මේ පිළිබඳ ඔබේ අවධානය යොමු කරමින්,

(i) අධ්‍යාපනය හා දර්ශනය අතර ඇති සබඳතාව නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) වැඩ ලෝකයට අවශ්‍ය නිපුණතා සම්පාදනයේ දී වැදගත් වන දාර්ශනික අදහස් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) පංති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයාට වැදගත් වන කාල් මාක්ස් හා ජෝන් ඩූවීගේ දාර්ශනික අදහස් **දෙක** බැගින් දක්වා, ඒවා පංති කාමරයේ දී යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

02. "විශ්ව පුරවැසියකු බිහි කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු ප්‍රබල දායකත්වයක් ලබා දෙයි."

(i) අධ්‍යාපන පරමාර්ථ හා අධ්‍යාපන අරමුණු කෙටියෙන් අර්ථ දක්වන්න. (ලකුණු 03)

(ii) අධ්‍යාපන අරමුණු සකස් කිරීමේ දී සැලකිය යුතු මූලාශ්‍ර **පහක් දක්වන්න**. (ලකුණු 05)

(iii) පංති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයාට සුවිශේෂී අරමුණු හඳුනා ගැනීමේ වැදගත්කම කරුණු **හතරක්** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

03. "අධ්‍යාපනය ජීවිතයේ එක්තරා කාලයකට පමණක් සීමා වූවක් නොව, එය සමස්ත දිවිය පුරා ම දිවෙන ක්‍රියාවලියකි." ඒ පිළිබඳ අවධානය යොමු කරමින්,

(i) යාවජීව අධ්‍යාපන සංකල්පය හඳුන්වන්න. (ලකුණු 03)

(ii) යාවජීව අධ්‍යාපනයේ අරමුණු **පහක්** ලියන්න. (ලකුණු 05)

(iii) ගෝලීය සමාජයක සාර්ථකත්වය සඳහා ගුරුවරයකුට යාවජීව අධ්‍යාපනය ඵලදායී වන අවස්ථා **හතරක්** විමර්ශනය කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

04. "පරම්පරාවෙන් පරම්පරාවට දැනුම, ආකල්ප, කුසලතා සම්ප්‍රේෂණය කරන්නේ ගුරුවරයා ය". ඉහත ප්‍රකාශය අවධාරණය කරමින්,

(i) වෙනස් වන සමාජ සන්දර්භයට අනුගත වන ඵලදායී ගුරුවරයකුගේ ලක්ෂණ **හයක්** පෙන්වා දෙන්න. (ලකුණු 03)

(ii) ඵලදායී ගුරුවරයකු ලෙස ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ පරිචයක් ලබා ගැනීමටත්, ස්වයං ඉගෙනුමෙහි යෙදමින් යාවත්කාලීන වීමටත් ප්‍රායෝගික ව අවශ්‍ය වන ඉගෙනුම් ක්ෂේත්‍ර **දෙකක්** දක්වන්න. (ලකුණු 05)

(iii) ඵලදායී ගුරුවරයකු ලෙස පාසලේ දී ඔබට ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති **දෙකක්** යෝජනා කර, එයින් ගුරු වෘත්තීය පෞරුෂය ඔප්නංවා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

## "ආ" කොටස

05. (i) බහු සංස්කෘතික අධ්‍යාපනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 03)

(ii) ගෝලීය සංස්කෘතියකට උචිත විශ්වීය පුරවැසියකු තැනීමට යාමේ දී ශිෂ්‍යයා මුහුණ පාන අභියෝග **දෙකක්** දක්වා, ඒවා ජය ගැනීමේ උපාය මාර්ග කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

(iii) පංති කාමරය තුළ විධිමත් සමූහ සබඳතා ගොඩනගා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායී කරගනු වස් ගුරුවරයකුට බහු සංස්කෘතික අධ්‍යාපනය වැදගත් වන ආකාරය කරුණු **හතරක්** ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 08)

06. (i) සමාජ ස්ථරායනය පිළිබඳ ඉදිරිපත් වී ඇති ප්‍රධාන න්‍යායන් අතරින් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) සමාජ සචලතාව කෙරෙහි බලපාන සාධක **හතරක්** දක්වා, ඉන් එක් සාධකයක් පිළිබඳ කෙටි හැඳින්වීමක් ලියන්න. (ලකුණු 05)

(iii) සමාජ පංතිය යන්න විග්‍රහ කර, එය අධ්‍යාපනයට බලපාන ආකාරය නිදසුන් **දෙකක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 08)

07. (i) ගුරු භූමිකාවේ ලක්ෂණ සැලකිල්ලට ගනිමින් ගුරු භූමිකාව පිළිබඳ නිර්වචනයක් ගොඩනගන්න. (ලකුණු 03)

(ii) ගුරුවරයාට වෘත්තීය සංවර්ධනයේ දී වැදගත් වන ගුරු ආචාරධර්ම ඇතුළත් යෝජනා **තුනක්** ඉදිරිපත් කර, ඒවායෙහි කාලීන වටිනාකම කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(iii) ගුරු භූමිකාවේ ස්වභාවය තීරණය වන සමාජයීය සාධක **දෙකක්** දක්වා, එම සාධක ගුරු භූමිකාවේ තත්ත්වය නඟා සිටුවීමට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

08. (i) සමාජානුයෝජනය යන්න අර්ථ දැක්වීම සඳහා නිර්වචනයක් ගොඩනගන්න. (ලකුණු 03)

(ii) සමාජානුයෝගී ක්‍රමශිල්ප **තුනක්** දක්වා, ඒ පිළිබඳ අවබෝධය ගුරුවරයාට වැදගත් වන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iii) සමාජානුයෝගී කාරක **හතරක්** නම් කර, ඉන් **එකක්** ගුරුවරයකුගේ දෛනික ක්‍රියාවලිය අර්ථවත් කිරීමට යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

********

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019
## PE0130(PE730) - තුලනාත්මක අධ්‍යාපනය සහ අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ගැටලු

### II කොටස

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. තුලනාත්මක අධ්‍යාපනය, රටක අනාගතයේ දී සිදුවිය හැකි අධ්‍යාපන දිශානතිය හා ප්‍රවණතාව පිළිබඳ ව සමස්ත චිත්‍රයක් ගොඩනැගීමට උපකාරීවන විෂය ක්ෂේත්‍රයකි.

(i) තුලනාත්මක අධ්‍යාපනයේ අරමුණු **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) තුලනාත්මක අධ්‍යාපනයේ ප්‍රවේශ **දෙකක්** දක්වා, කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ඉන් එක් ප්‍රවේශයක් තෝරා ගෙන වර්තමාන අධ්‍යාපන ගැටලු විසඳීම සඳහා එම ප්‍රවේශය යොදා ගත හැකි ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

02. බටහිර ජාතීන්ගේ පැමිණීමෙන් ශ්‍රී ලාංකීය අධ්‍යාපනය කෙරෙහි පමණක් නොව වෙනත් සමාජ විද්‍යාත්මක සාධක කෙරෙහි ද ප්‍රබල බලපෑමක් සිදු විය.

(i) බ්‍රිතාන්‍ය යුගයේ අධ්‍යාපන අරමුණු **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) එක් අරමුණක් ඉටු කර ගැනීම සඳහා යොදා ගත් ක්‍රමවේදයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) බ්‍රිතාන්‍ය පාලනයේ පසුකාලීන බලපෑමක් වර්තමාන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධ වී ඇති ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

03. ශ්‍රී ලංකා අධ්‍යාපනයේ වර්තමානයට ද ගැළපෙන වෙනස්කම් රැසක් කන්නන්ගර යුගය තුළ සිදුවිය.

(i) කන්නන්ගර අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ මූලික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඔබ නම් කළ එක් යෝජනාවක් වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ ක්‍රියාත්මක වන්නේ දැ'යි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) (ii)හි නම් කළ යෝජනාව ක්‍රියාත්මක කිරීම මගින් වර්තමාන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ශිෂ්‍ය පෝෂණය සිදු කළ හැක්කේ කෙසේ දැ'යි උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.



CamScanner

04. 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සැකසීමේ දී ශිෂ්‍යයාගේ නිපුණතා සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

(i) 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල දී ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දුන් නවාංග **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉන් එක් නවාංගයක් ක්‍රියාත්මක වන ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

(iii) ප්‍රාථමික අධ්‍යාපනයේ තක්සේරුකරණ ක්‍රියාවලිය මගින් ද්විතීයික අංශ ගුරු කාර්යභාරය පහසු කිරීමට ලැබෙන පිටිවහල කෙබඳු දැ'යි උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

05. චීනය අධ්‍යාපන ක්‍රියාවලීන් මත වේගවත් ආර්ථික වර්ධනයක් අත් කර ගත් රටකි.

(i) චීනයේ අධ්‍යාපන ප්‍රතිපත්ති හා අරමුණු **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉන් එක් අරමුණක් ඉටු කර ගැනීම සඳහා යොදාගත් උපක්‍රමයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) චීනයේ අධ්‍යාපන ක්‍රමය තුළ පවතින වෘත්තීය සංවර්ධන අවස්ථා වර්තමාන ශ්‍රී ලාංකීය අධ්‍යාපනය හා කෙබඳු සම්බන්ධතාවක් දක්වන්නේ දැ'යි උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

06. රටක සමාජ ආර්ථික අවශ්‍යතා වෙනස්වීමත් සමඟ අධ්‍යාපනය ද වෙනස් විය යුතු ය.

(i) ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපනය තුළ දක්නට ලැබෙන නව ප්‍රවණතා **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉන් එක් ප්‍රවණතාවක් ක්‍රියාත්මක වීම මගින් ශිෂ්‍යයාට ලැබෙන ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) අධ්‍යාපනය හා රැකියා ලෝකය අතර පවතින දුරස්ථභාවය අවම කිරීම සඳහා ප්‍රායෝගික යෝජනා **තුනක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

07. ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි බලපාන අධ්‍යාපන ගැටලු රාශියකි.

(i) එවැනි ගැටලු **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉන් එක් ගැටලුවක් පංති කාමර කළමනාකරණය කෙරෙහි බලපා ඇති ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් එම ගැටලුව විසඳාලීම සඳහා ගුරුවරයකු වශයෙන් ඔබේ මැදිහත්වීම කෙසේ විය යුතු දැ'යි උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.



CamScanner

08. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ආශ්‍රයෙන් පහත සඳහන් මාතෘකා අතරින් **හතරක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ජාතික ඒකාබද්ධතාව ඇති කිරීම සඳහා අධ්‍යාපනයේ දායකත්වය

(ii) ළඟ ම පාසල හොඳ ම පාසල වැඩසටහන

(iii) තොරතුරු තාක්ෂණයේ වැදගත්කම

(iv) ළමා අපයෝජනය අවම කිරීමෙහි ලා ගුරු කාර්යභාරය

(v) මානව ප්‍රාග්ධන සංකල්පය

(vi) ගුරු අධ්‍යාපනයේ කාලීන අවශ්‍යතා

(vii) පෞද්ගලික විශ්වවිද්‍යාල ඇරඹීම

(ලකුණු 04 x 4 = ලකුණු 16)

********



CamScanner

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

3128

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019
## PE0160 (PE760) - අධ්‍යාපන නායකත්වය සහ කළමනාකරණය

### II කොටස

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) සංවිධානයක මූලික ලක්ෂණ **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(ii) පාසල ද සංවිධානයකි. ඉහත (i)හි දැක් වූ ලක්ෂණ පාසලක දැකිය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ඉහත දැක් වූ ලක්ෂණ පාසලේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ආධාර වන ආකාරය නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

02. (i) නායකත්වය පිළිබඳ නිර්වචනයක් දෙන්න. (ලකුණු 03)

(ii) ගුරු නායකත්ව භූමිකාවේ දී "උපදේශන නායකත්වය" වැදගත් වේ. උපදේශන නායකත්වය යනු කුමක් දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ගුරුවරයා උපදේශන නායකත්වයෙන් ක්‍රියා නොකිරීම නිසා සිදුවිය හැකි අහිතකර තත්ත්ව **හතරක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

03. (i) ඵලදායී පාසල නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) ඵලදායී පාසලක ලක්ෂණ **පහක්** දක්වන්න. (ලකුණු 05)

(iii) පාසලක කාර්යක්ෂමතාව හා ඵලදායීතාව නැංවීම සඳහා සහභාගිත්ව සැලසුම්කරණය ආධාර වන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

04. පියසෝම විදුහල්පති ජනප්‍රිය හා සමාජශීලී නායකයකු වන අතර, පාසලේ භෞතික සම්පත් සංවර්ධනයේ දී විශේෂ දක්ෂතා පෙන්නුම් කරයි. එමෙන් ම පාසල් කාර්යාලය නිරතුරුව ම පුද්ගලයන්ගෙන් පිරී පැවතීම හා විදුහල්පති දුරකථන ඇමතුම්වලට නිරතුරුව ම පිළිතුරු ලබාදීම ද දැකිය හැකි ය. මේ නිසා ම විදුහල්පතිට අධීක්ෂණ ක්‍රියාවලියට සහභාගි වීමට නොහැකි වන අතර තම රාජකාරි කටයුතු නිමා කිරීම සඳහා පාසල් කාලයෙන් පසු හා නිවාඩු දිනවල පාසලේ රැඳී සිටීමට සිදු වී ඇත. එසේ වුව ද උප විදුහල්පතිවරුන්ගේ හා ගුරු මණ්ඩලයේ මෙන් ම සේවකයන්ගේ සහය ලබා ගැනීමට දක්ෂ වූ බැවින් පාසලේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට සිදු වන බාධා අඩු වී ඇත.

අ.පි.බ.

(i) සම්පත් කළමනාකරණය අර්ථ දක්වන්න. (ලකුණු 03)

(ii) පාසලක සම්පත් කළමනාකරණයේ දී මානව සම්පත් සේ සැලකෙන්නේ මොනවා ද? (ලකුණු 05)

(iii) (අ) මෙම විදුහල්පතිවරයා කළමනාකරණයේ දුර්වලතා පෙන්වන්නේ කුමන සම්පත් සම්බන්ධව ද? (ලකුණු 02)

(ආ) එම දුර්වලතා මඟහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 06)

05. (i) සන්නිවේදන සංකල්පය හඳුන්වන්න. (ලකුණු 03)

(ii) පාසලෙහි සන්නිවේදන ක්‍රියාවලිය සිදු කෙරෙන මධ්‍යස්ථාන **තුනක්** නම් කර, පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ගුරුවරයකුට පංති කාමර කළමනාකරණයේ දී සන්නිවේදනය වැදගත් වන අවස්ථා **හතරක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

06. (i) පාසල් ප්‍රජා සම්බන්ධතාව අර්ථ දක්වන්න. (ලකුණු 03)

(ii) විෂය භාර ගුරුවරයකු ලෙස ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ප්‍රජා සම්බන්ධතා ආධාර කර ගත හැකි අවස්ථා **හතරක්** දක්වා පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) පාසල් පද්ධතිය කෙරෙහි ප්‍රජා සම්බන්ධතා ප්‍රතිශේධාත්මක ව බලපෑ හැකි ආකාර **තුනක්** උදාහරණ **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

07. විද්‍යාලයේ සිසුන් අතර ඇතිවන ගැටුම් ඉක්මනින් සමථයකට පත් කළ ද ශිෂ්‍ය නායකයින් හා ඉහළ ශ්‍රේණිවල සිසුන් අතර නිරතුරුව ම සුළු සුළු ගැටුම් ඇති වන බව නිරීක්ෂණය කළ විදුහල්පතිට විශේෂයෙන් ම 12 වන ශ්‍රේණි හා 13 වන ශ්‍රේණි සිසුන් ශිෂ්‍ය නායකයින්ගේ උපදෙස් පිළිපැදීමට මැලි වන බව පැහැදිලි විය. විදුහල්පති මෙම ගැටුම් කළමනාකරණය සඳහා වහා ම පියවර ගත යුතු බව අවබෝධ කර ගත්තේ ය.

(i) ගැටුමක් යනු කුමක් දැ'යි දක්වන්න. (ලකුණු 03)

(ii) ඉහත දැක් වූ ගැටුම කළමනාකරණය නොකිරීමෙන් උදාවිය හැකි තත්ත්වයන් මොනවා ද? (ලකුණු 05)

(iii) ධනාත්මක ලෙස හා සෘණාත්මක ලෙස ගැටුමක් අර්ථකථනය කළ හැකි ය. මෙම ගැටුම කළමනාකරණය සඳහා වඩාත් උචිත අර්ථකථන ආකාරය කුමක් ද? ඔබේ තෝරා ගැනීමට හේතු දක්වන්න. (ලකුණු 08)

08. (i) පාසල් පාදක ගුරු පුහුණුව යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 03)

(ii) ඵලදායී පාසලක් ගොඩනැගීමේ දී පාසල් පාදක ගුරු පුහුණුව උචිත ක්‍රමවේදයක් ලෙස සලකන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) "පාසලක ඵලදායීතාව කෙරෙහි අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය වැදගත් වේ."
ඉහත ප්‍රකාශය සම්බන්ධ ව විමර්ශනාත්මක ව කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

********



CamScanner

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

3126

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019

### PE0150 (PE750) - අධ්‍යාපන මිනුම, තක්සේරුකරණය සහ ඇගයුම
### II කොටස

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) 'අධ්‍යාපන ඇගයුම' යන සංකල්පය අර්ථ දක්වන්න. (ලකුණු 03)

(ii) අධ්‍යාපන ඇගයුම් ක්‍රියාවලිය තුළින් පොදුවේ ගුරු-ශිෂ්‍ය දෙපාර්ශ්වයට ලබා ගත හැකි ප්‍රයෝජන **පහක්** දක්වන්න. (ලකුණු 05)

(iii) ඔබ උගත් 'ඇගයුම් ප්‍රවේශ' දක්වා, ඒවා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොදා ගත හැකි අවස්ථා උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

02. (i) 'ඉගෙනුම් පල' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) මනෝචාලක ක්ෂේත්‍රය පිළිබඳ ඊ.ජේ. සිම්ප්සන් විසින් ඉදිරිපත් කරන ලද වර්ගීකරණයේ මට්ටම් දක්වන්න. (ලකුණු 05)

(iii) පාඩමක් සඳහා ඉගෙනුම් පල පිහිටුවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දක්වා, පාඩමක් සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර තුන යටතේ ඉගෙනුම් පල දක්වන්න. (ලකුණු 08)

03. (i) පිළිතුරු පත්‍ර ඇගයීමේ දී ලකුණු විචලනය සිදු නොවන විෂය බද්ධ පරීක්ෂණ වර්ග **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඔබ කැමති විෂයයක් තෝරා ගෙන ඕනෑම ශ්‍රේණියක් සඳහා ඉහත පරීක්ෂණ වර්ග තුනට ගැළපෙන ප්‍රශ්න **තුනක්** නිර්මාණය කරන්න. (ලකුණු 05)

(iii) (අ) රචනා පරීක්ෂණ භාවිතයේ ප්‍රයෝජන **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ) රචනා පරීක්ෂණවල පිළිතුරු ඇගයීමේ දී පැන නගින ගැටලු විසඳා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04)

04. (i) ගුණාත්මක පරීක්ෂණයක පැවතිය යුතු ප්‍රධාන ලක්ෂණ **තුන** ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) ගුණාත්මක පරීක්ෂණයක් සැකසීමේ දී සුවිශේෂණ වගුව සැකසීම ඉතාම අවශ්‍ය වේ. එවැනි සුවිශේෂණ වගුවක ප්‍රයෝජන දක්වන්න. (ලකුණු 05)

(iii) පරීක්ෂණ පරිපාලනයේ දී විභාග ශාලාධිපතිවරයකු අවධානයට ලක් කළ යුතු කරුණු හඳුන්වා, ඒවා ගුණාත්මක පරීක්ෂණයක් සඳහා බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.



CamScanner

05. (i) විසිරීම් පිළිබඳ මිනුම් තුනක් දක්වන්න. (ලකුණු 03)

(ii) පහත දැක්වෙන්නේ සිසුන් 50 දෙනකු විද්‍යා විෂයය සඳහා ලබා ගත් ලකුණු ආශ්‍රයෙන් සැකසූ සංඛ්‍යාත ව්‍යාප්තියකි.

| පංති ප්‍රාන්තර | සංඛ්‍යාතය |
|---|---|
| 80 – 84 | 02 |
| 75 – 79 | 03 |
| 70 – 74 | 05 |
| 65 – 69 | 02 |
| 60 – 64 | 09 |
| 55 – 59 | 11 |
| 50 – 54 | 08 |
| 45 – 49 | 03 |
| 40 – 44 | 02 |
| 35 – 39 | 05 |

මාත පන්තියේ මධ්‍ය අගය උපකල්පිත මධ්‍යන්‍යය ලෙස ගෙන ඉහත ලකුණු ව්‍යාප්තියේ සමාන්තර මධ්‍යන්‍යය ආසන්න දශමස්ථාන දෙකකට සොයන්න. ඒ සඳහා

$\bar{X} = A + i\left(\frac{\sum fd}{n}\right)$ සූත්‍රය භාවිත කරන්න. (ලකුණු 05)

(iii) (අ) ඉහත ලකුණු ව්‍යාප්තියේ සම්මත අපගමනය සොයන්න. ඒ සඳහා

$SD = i\sqrt{\left(\frac{\sum fd^2}{n}\right) - \left(\frac{\sum fd}{n}\right)^2}$ සූත්‍රය භාවිත කරන්න. (ලකුණු 05)

(ආ) මධ්‍යන්‍යය හා සම්මත අපගමනය සඳහා ලැබූ අගයන් ඇසුරින් සිසුන්ගේ විද්‍යා විෂයය සාධන මට්ටම පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 03)

06. (i) ලකුණු නිරූපණය කිරීමට යොදා ගන්නා කොටු කෙඳි සටහනක දළ සටහනක් ඇඳ එහි සංඛ්‍යා ව්‍යාප්තියට අදාළ පහත අංග පිහිටන ස්ථාන ලකුණු කරන්න.

(අ) අවම අගය (ආ) උපරිම අගය (ඇ) කෙඳි

(ඈ) $Q_1$ (ඉ) $Q_2$ (ඊ) $Q_3$ (ලකුණු 03)

(ii) පහත දැක්වෙන්නේ 11 ශ්‍රේණියේ පංතියක සිසුන් 50 දෙනකු අ.පො.ස. (සා.පෙළ) ගණිතය පෙරහුරු පරීක්ෂණයක් සඳහා ලබාගත් ලකුණු ආශ්‍රයෙන් සැකසූ සංඛ්‍යාත ව්‍යාප්තියකි.

| පංති ප්‍රාන්තර | සංඛ්‍යාතය |
|---|---|
| 80-84 | 02 |
| 75-79 | 04 |
| 70-74 | 05 |
| 65-69 | 08 |
| 60-64 | 10 |
| 55-59 | 09 |
| 50-54 | 06 |
| 45-49 | 04 |
| 40-44 | 02 |

ඉහත සංඛ්‍යාත ව්‍යාප්තිය ආශ්‍රයෙන් සංඛ්‍යාත බහුඅස්‍රය නිර්මාණය කරන්න. (ලකුණු 05)

අ.පි.බ.

(iii) (අ) ඉහත ඔබ නිර්මාණය කළ සංඛ්‍යාත බහුඅස්‍රය අනුව මෙම පංතියේ සිසුන් සා.පෙළ විභාගයේ දී කිනම් සාධනයක් ලබා ගත හැකි ද යන්න පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 04)

(ආ) සංඛ්‍යාත බහුඅස්‍රයක කුටිකතාව අනුව ශිෂ්‍ය සාධනය අර්ථකථනය කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

07. (i) පහත දැක්වෙන සහසම්බන්ධතා සංගුණකවලට අදාළ සහසම්බන්ධතාවයන්ගේ ස්වභාවය දක්වන්න.

(1) +.8 (2) -0.5 (3) 0 (ලකුණු 03)

(ii) පහත දැක්වෙන්නේ සිසුන් 10 දෙනෙක් ඉංග්‍රීසි පාඨමාලාවක ප්‍රවේශ පරීක්ෂණයේ දී හා පාඨමාලා අවසාන පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු දැක්වෙන වගුවකි.

| ශිෂ්‍යයා | A | B | C | D | E | F | G | H | I | J |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රවේශ පරීක්ෂණය X | 45 | 60 | 40 | 55 | 60 | 50 | 70 | 80 | 39 | 75 |
| අවසාන පරීක්ෂණය Y | 65 | 68 | 70 | 55 | 81 | 60 | 75 | 82 | 50 | 80 |

එම ලකුණු කාණ්ඩ දෙක අතර සහසම්බන්ධතා සංගුණකය ස්පියර්මන් තරා පටිපාටි ක්‍රමයට ගණනය කරන්න. ඒ සඳහා

$$r = 1 - \left(\frac{6\sum d^2}{n(n^2-1)}\right)$$ සූත්‍රය යොදා ගන්න. (ලකුණු 05)

(iii) (අ) ඉහත ලකුණු කාණ්ඩ දෙක අතර සහසම්බන්ධතාව දැක්වීමට විසිරි තිත් සටහන නිර්මාණය කරන්න. (ලකුණු 04)

(ආ) සහසම්බන්ධතා සංගුණකය හා විසිරි තිත් සටහන ආශ්‍රයෙන් ප්‍රවේශ පරීක්ෂණයේ වලංගුතාව පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 04)

08. (i) තක්සේරුකරණයේ සහ ඇගයීමේ නව ප්‍රවණතා **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(ii) පාසල් පාදක තක්සේරුකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම තුළින් ගුරුවරයකුට ලැබෙන ප්‍රයෝජන **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) (අ) යම් විෂයයක ඇගයීම් වාර පහක දී සිසුන් 05 දෙනෙක් ලබා ගත් ලකුණු පෙන්වීමට තීරු ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න. (ලකුණු 05)

(ආ) ඔබ නිර්මාණය කළ තීරු ප්‍රස්තාරය මගින් ලකුණු නිරූපණය කිරීමේ ප්‍රයෝජන මොනවා ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 03)

********

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

3128

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019
## PE0170(PE770) - අධ්‍යාපන මාර්ගෝපදේශය සහ උපදේශනය

### II කොටස

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. පාසල් පද්ධතිය තුළ කටයුතු කරන සෑම ගුරුවරයකු ම මාර්ගෝපදේශය හා උපදේශන ක්‍රියාවලිය පිළිබඳ ව මනා අවබෝධයක් තිබිය යුතු වේ.

    (i) මාර්ගෝපදේශය හා උපදේශනය යන සංකල්ප අතර සමානකම් දක්වන ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03)

    (ii) පාසල් මාර්ගෝපදේශ හා උපදේශන ක්‍රියාවලිය සඟය කර ගත හැකි උපදේශන ශාඛා **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

    (iii) ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ මාර්ගෝපදේශය හා උපදේශනය ප්‍රචලිත කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 08)

2. පහත සඳහන් සිද්ධිය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

    "ඉතා දඟකාර, මුරණ්ඩු, අමන්ත, පංතිභාර ගුරුවරිය අසලට පැමිණ දෙතොල් සපා ගනිමින්, බිම බලාගෙන සුසුම්ලමින් විනාඩි කිහිපයක් ගත කළේ ය. ගුරුවරිය අමන්තට පැවසුවේ නොපැකිල ව ගැටලුවක් ඇත්නම් පවසන ලෙසත්, ඇය අමන්තට උදව් කිරීමට සූදානම් බවත්, අමන්තගේ ගැටලුව කිසිවකුට දැන ගැනීමට ඉඩ නොතබන බවත් ය".

    (i) අමන්තට උපදේශනය වෙත යොමු වීමට බලපෑ ගුරුවරයා සතු උපදේශන ගුණාංග **හයක්** ලියන්න. (ලකුණු 03)

    (ii) අමන්තගේ ගැටලුව මැනවින් හඳුනා ගැනීමට මෙම ගුරුවරිය යොදා ගත යුතු උපදේශන කුසලතා **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

    (iii) එම සිද්ධියෙන් පැහැදිලි වන්නේ එම ගුරුවරිය උපදේශන ආචාරධර්මවලට අනුකූල ව කටයුතු කරන බව යි. සෑම ගුරුවරයකුට ම උපදේශන ආචාරධර්ම පිළිබඳ අවබෝධය වැදගත් වන ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

3. ගෝලීය ප්‍රවණතා හමුවේ ශිෂ්‍යයාගේ උපදේශන අවශ්‍යතා වර්ධනය වනවා සේ ම උපදේශන කාර්යයේ දී ගුරුවරයාට ද විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදු වේ.

(i) ශිෂ්‍යයාට උපදේශනය අවශ්‍ය වීමට බලපාන සාධක **හයක්** ලියන්න. (ලකුණු 03)

(ii) ද්විතීයික පාසලේ සිසුන්ට ආතතියකින් තොර ව අධ්‍යයන කටයුතු කිරීම සඳහා ඔබ අවධාරණය කරන කරුණු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ගෝලීය ප්‍රවණතා හමුවේ උපදේශකවරයා මුහුණ දෙන අභියෝග **තුනක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

4. වෘත්තීය මාර්ගෝපදේශය සහ උපදේශනය පිළිබඳ ව ශිෂ්‍යයා ව දැනුවත් කිරීම ගුරුවරයාගේ පමණක් නොව දෙමව්පියන්ගේ ද කාර්යභාරයකි.

(i) වෘත්තීය ගවේෂණය සඳහා ශිෂ්‍යයාට සහයවීමට ගුරුවරයාට ගත හැකි ක්‍රියාමාර්ග **හයක්** ලියන්න. (ලකුණු 03)

(ii) පාසල් වෘත්තීය මාර්ගෝපදේශයේ අරමුණු **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) "වෘත්තීය මාර්ගෝපදේශය සඳහා දෙමව්පියන්ගේ කාරයභාරය" යන මාතෘකාව යටතේ කථාවක් කිරීමට ඔබට භාර වී ඇත. වෘත්තීය උපදේශන න්‍යායන් ඇතුළත් කර ගනිමින් එම දේශනය සඳහා ඉදිරිපත් කිරීමට අපේක්ෂිත කරුණු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 08)

5. පහත දැක්වෙන්නේ පුවත්පතකින් උපුටා ගත්තකි. එය කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"පාසලේ සඵල උපදේශන සේවාවක් ක්‍රියාත්මක කරමින් ශිෂ්‍ය ගැටලු අවම කර ගැනීමට සහය වීම හේතුවෙන් අඛණ්ඩ ව තෙවන වරටත් ගාමිණී මහා විද්‍යාලයේ උපදේශනය භාර ගුරුවරිය සම්මානයට පාත්‍ර වී ඇත."

**දිනසර පුවත්පත**

(i) මෙම පාසලේ ක්‍රියාත්මක වන උපදේශන සේවා **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) උපදේශන කාර්යය විධිමත් ව පවත්වා ගැනීම සඳහා මෙම පාසලේ සුදුසු ස්ථානයක් තිබීම ද ජයග්‍රහණයට හේතු වී ඇත. ඔබගේ පාසලේ උපදේශන කාමරයක් සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) "සමපදස්ථ උපදේශනය යොවුන්වියේ දරුවන්ගේ ගැටලු අවම කර ගැනීමට පාසල් උපදේශකවරයාට සහය කර ගත හැකි ය."

ඉහත කියමන නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.



CamScanner

6. පුද්ගල ගැටලු විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් විශ්ලේෂණය කිරීමේ හැකියාව උපදේශකයකු සතුවන වැදගත් ම නිපුණතාවකි.

(i) උපදේශන ප්‍රවේශ පිළිබඳ අවබෝධය ගුරුවරයාට වැදගත්වීමට කරුණු **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) "විශ්වවිද්‍යාල වරම් නොලැබීමෙන් ඉච්ඡාභංගත්වයට පත් වී ඇති අරුණ පවසන්නේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය නොලබා ජීවත්වීම එලක් නොමැති බව යි." මෙම සිද්ධිය හේතුවාදී ප්‍රවේශයට අනුව විශ්ලේෂණය කරන්න. (ලකුණු 05)

(iii) යෞවනෝදයට පත්වීමත් සමඟ අසාමාන්‍ය ශාරීරික වර්ධනයක් පෙන්නුම් කරන දක්ෂ ශිෂ්‍යාවක් වූ නිශාදි ක්‍රමයෙන් අධ්‍යාපනයට වඩා තමා පිළිබඳ ව සිතීමට කාලය ගත කරන්නීය. මානවවාදී ප්‍රවේශය (සංජානනික හා ප්‍රපංචමය ප්‍රවේශය) අදාළ ක්‍රම ශිල්ප තුනක් ආශ්‍රයෙන් මැදිහත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

7. 4 ශ්‍රේණියේ ඉගෙනුම ලබන චමරි මව්බස හා ගණිතය සඳහා අවම සාධනයක් ඇති ශිෂ්‍යාවකි. තව ද ඇය ඉතා කලහකාරී ලෙස පංතියේ හැසිරීම ගුරුවරියට පමණක් නොව අනෙකුත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද හිරිහැරයක් වී ඇත.

(i) උපදේශනයේ දී තොරතුරු රැස් කරගැනීමට පරීක්ෂණ ක්‍රම ශිල්ප භාවිතයේ වාසි **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) චමරිගේ කලහකාරී චර්යාව පිළිබඳ ව දෙමව්පියන්ගෙන් තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා භාවිත කළ හැකි ප්‍රශ්න 10කින් යුතු සම්මුඛ සාකච්ඡා නියමාවලියක් සකස් කරන්න. (ලකුණු 05)

(iii) මෙම ශිෂ්‍යයාව සක්‍රිය ලෙස අධ්‍යයන කටයුතු සඳහා යොමු කරවා ගැනීමට ගුරුවරයාට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** නිදසුන් සහිත ව විස්තර කරන්න (ලකුණු 08)

8. නිවැරදි වෘත්තීය තොරතුරු ශිෂ්‍යා වෙත නොලැබීම නිසා පාසල් හැරයන්නන් බොහොමයක් වෘත්තීය ලෝකය තුළ අතරමං වන බව පර්යේෂණවලින් අනාවරණය වී ඇත.

(i) වෘත්තීය තොරතුරු ලබා ගත හැකි ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර **හයක්** ලියන්න. (ලකුණු 03)

(ii) වෘත්තීය තොරතුරු ශිෂ්‍යයාට වැදගත්වීමට බලපාන සාධක **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ඔබගේ පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අනාගතයේ දී මෙවැනි තත්ත්වයකට මුහුණ නොදීමට නම් ශිෂ්‍යයා වෙත වෘත්තීය තොරතුරු ලබා දීමට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 08)

********



CamScanner

3127

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

විභාග දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

A

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019
## PE0180 (PE780) – ඉගැන්වීමේ ශිල්පක්‍රම

### II කොටස

"අ" කොටසින් **එක්** ප්‍රශ්නයක් ද "ආ" කොටසින් ප්‍රශ්න **හතරක්** ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

"අ"

01. සෑම ගුරුවරයකු ම ඉගැන්වීමේ ප්‍රවේශ, ක්‍රම, පටිපාටිය හා ශිල්පක්‍රම අතර ඇති අන්‍යෝන්‍ය සබඳතාවට අනුගත ව කටයුතු කිරීම අත්‍යවශ්‍ය ය.

(i) විෂය ඉගැන්වීමට අදාළ ව "ඉගැන්වීමේ ප්‍රවේශ" (Teaching Approach) තීරණයේ දී ගුරුවරයාට බලපාන ප්‍රධාන සාධක **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉගැන්වීමේ ප්‍රවේශ හා ඉගැන්වීමේ ක්‍රම අතර ඇති සම්බන්ධතාව එක් උදාහරණයක් ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 05)

(iii) ඔබගේ ප්‍රධාන විෂයයෙන් පාඩමක් තෝරා ගන්න. එම පාඩම සඳහා එක් ගුරු කේන්ද්‍රීය ක්‍රමයක් සහ එක් ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමයක් බැගින් යෝජනා කරන්න. ඔබ තෝරා ගත් පාඩම යෝජිත ක්‍රම දෙකට ක්‍රියාත්මක කිරීමේ දී ඇති විය හැකි බලපෑම පහත ක්ෂේත්‍ර ඔස්සේ පැහැදිලි කරන්න.

- අපේක්ෂිත ඉගෙනුම් පල සාධනය
- ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ශිෂ්‍ය සහභාගිත්වය

(ලකුණු 08)

02. "ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම පිළිබඳ ව පුළුල් සහ නිවැරදි අවබෝධයක් ලබා තිබීම ගුරු කාර්යය ඵලදායී කරයි."

(i) ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම සහ ඉගැන්වීමේ විශේෂ ක්‍රම අතර ඇති සමානකමක් සහ වෙනස්කමක් දක්වන්න. (ලකුණු 03)

(ii) ඉගැන්වීමේ විශේෂ ක්‍රම තීරණය කිරීමේ දී ගුරුවරයා සැලකිලිමත් විය යුතු සාධක **පහක්** දක්වන්න. (ලකුණු 05)

(iii) "ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම රැසක් තිබුණ ද, සෑම විෂයකට ම සෑම ඉගැන්වීමේ ක්‍රමයක් ම යොදා ගැනීම අසාර්ථක වෑයමකි." මෙම ප්‍රකාශය ඔබගේ ප්‍රධාන විෂයය ආශ්‍රිත ව උදාහරණ **තුනක්** දක්වමින් සහේතුක ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

"ආ"

03. ප්‍රශ්නකරණය වෙනම ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස යොදා ගැනීමට වඩා වැදගත් වන්නේ අනෙකුත් ඉගැන්වීම් ක්‍රමවල දී ප්‍රශ්නකරණය ශිල්පක්‍රමයක් ලෙස යොදා ගැනීම යි.

(i) ඉහත ප්‍රකාශයට ඔබේ එකඟතාව කරුණු **තුනකින්** ඉදිරිපත් කරන්න. (ලකුණු 03)

(ii) ඉගෙනුම් ක්‍රම ශිල්පයක් වශයෙන් එක් එක් පියවරක දී ප්‍රශ්නකරණය යොදා ගැනීමේ දී ගුරුවරයකු සැළකිලිමත් විය යුතු සාධක **පහක්** දක්වන්න. (ලකුණු 05)

(iii) ඔබගේ ප්‍රධාන විෂයයෙන් පාඩමක් තෝරා ගන්න. එම පාඩමේ එක් පියවරක දී ප්‍රශ්නකරණය ශිල්ප ක්‍රමයක් වශයෙන් යොදා ගන්නා ආකාරය පහත ශීර්ෂ ඔස්සේ උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

- අපේක්ෂිත විෂය කරුණු ඉදිරිපත් කිරීමේ දී
- විෂය කරුණු තහවුරු වී දැ'යි සොයා බැලීමේ දී

(ලකුණු 08)

04. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පාසල් මුහුණ පා ඇති අවාසිදායක තත්ත්ව ජය ගැනීමේ මාර්ගයක් වන්නේ බහු ශ්‍රේණි ඉගැන්වීම යොදා ගැනීම යි.

(i) බහු ශ්‍රේණි ඉගැන්වීම් ක්‍රමයේ මූලික ගුණාංග **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) බහු ශ්‍රේණි ඉගැන්වීම යොදා ගැනීමට සිදු වන්නේ කිනම් අවාසිදායක තත්ත්ව මගහරවා ගැනීම සඳහා ද යන්න හේතු **පහකින්** දක්වන්න. (ලකුණු 05)

(iii) බහු ශ්‍රේණි ඉගැන්වීමේ දී එහි දෙවන පියවර වන "අභ්‍යාස පියවර" (Practice) ක්‍රියාත්මක කරන ආකාරය ඔබගේ විෂය ආශ්‍රිත උදාහරණයක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

05. අතීතයේ දී මෙන් ම වර්තමානයේ දී ද ද්විතීයික ශ්‍රේණි පංතිකාමරවල බහුලව යොදා ගන්නා ඉගැන්වීම් ක්‍රමයක් වන්නේ දේශන ක්‍රමය යි.

(i) දේශන ක්‍රමය යොදා ගැනීමට ගුරුවරුන් යොමු වීමට බලපා ඇති හේතු **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(ii) දේශන ක්‍රමය ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස යොදා ගැනෙන පංති කාමරයක ඵලදායී ඉගෙනුමක් සිදු නොවන බව සනාථ කිරීමට ඉදිරිපත් කළ හැකි සාක්ෂි **පහක්** දක්වන්න. (ලකුණු 05)

(iii) දේශන ක්‍රමය බහුල වශයෙන් යොදා ගෙන ඔබගේ විෂයය උගන්වන නවක ගුරුවරයකුට එමගින් සිදුවිය හැකි අහිතකර ප්‍රතිඵල **තුනක්** දක්වා, ඒවා අවම කර ගැනීම සඳහා යොදා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** විෂය ආශ්‍රිත ව උදාහරණ දක්වමින් යෝජනා කරන්න. (ලකුණු 08)

අ.පි.බ.



CamScanner

06. "වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයෙන් ඇරඹී ක්‍රමයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට ද එක් වූ ගැටලු පාදක ඉගෙනුම් ක්‍රමය (Problem Based Learning Method) උසස් අධ්‍යාපනයේ දී මෙන් ම ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ දී ද සාර්ථක ව යොදා ගත හැකි ය."

(i) ගැටලු පාදක ඉගෙනුම් ක්‍රමයේ ඇති විශේෂ ලක්ෂණ **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(ii) ගැටලු පාදක ඉගෙනුම් අවස්ථාවක් තෝරා ගැනීමේ දී ගුරුවරයා අනුගමනය කළ යුතු ප්‍රධාන පියවර **පහක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

(iii) ඔබගේ ප්‍රධාන විෂයයෙන් ගැටලු පාදක ඉගෙනුම යොදා ගනිමින් ක්‍රියාත්මක කළ හැකි පාඩමක් තෝරා ගන්න. එය ක්‍රියාත්මක කරන ආකාරය අදාළ පියවර මගින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

07. "ප්‍රත්‍යවේක්ෂණය වූ කලී ගුරු කාර්යය මෙන් ම සිසු ඉගෙනුම ද අර්ථවත් කරන්නා වූ උපාය මාර්ගයකි."

(i) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා ප්‍රත්‍යවේක්ෂණයේ යෙදිය යුතු ප්‍රධාන අවස්ථා **තුන** නම් කරන්න. (ලකුණු 03)

(ii) ඔබගේ ප්‍රධාන විෂය ඉගැන්වීමේ දී ප්‍රත්‍යවේක්ෂණයෙන් හඳුනා ගත් ඉගෙනුම් ගැටලු ක්ෂේත්‍ර **පහක්** නම් කරන්න. (ලකුණු 05)

(iii) එක් ගැටලු ක්ෂේත්‍රයකට අදාළ ව තෝරා ගත් සුවිශේෂී ගැටලුවක් විසඳීම සඳහා ඔබ ගන්නා ලද ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමෙන් පසු අවසාන ප්‍රත්‍යවේක්ෂණ පහත සඳහන් ශීර්ෂ ඔස්සේ උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

- ගුරුවරයා ලෙස ඔබ වෙනස් වූ ආකාරය
- ඉගෙනුම් ගැටලු සහිත සිසුන් වෙනස් වූ ආකාරය
- පංති කාමර පරිසරය වෙනස් වූ ආකාරය

(ලකුණු 08)

08. "ගුරුවරයාගේ ඉගැන්වීම මෙන් ම සිසුන්ගේ ඉගෙනුම ද ඵලදායී වීම රඳා පවතින්නේ ගුරුවරයාගේ ඉගෙනුම් සම්පත් තෝරා ගැනීම මෙන් ම ඒවා භාවිත කරන ආකාරය මත ය."

(i) ගුරුවරයකුට යොදා ගත හැකි සමාජ සම්පත් වර්ග **දෙක** සහ ඒවාට **එක්** උදාහරණය බැගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 03)

(ii) ඔබගේ ප්‍රධාන විෂය ආශ්‍රිත ව තෝරා ගත් නිපුණතාවක් සංවර්ධනය සඳහා යොදා ගත හැකි ඉගෙනුම් සම්පත් **පහක්** නිපුණතාවට අදාළ පාඩම් මාතෘකා සහිත ව දක්වන්න. (ලකුණු 05)

(iii) ඉහත දක්වන ලද එක් ඉගෙනුම් සම්පතක් තෝරා ගන්න. එම ඉගෙනුම් සම්පත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායි කර ගැනීම සඳහා භාවිත කරන ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

********



CamScanner

© [සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved.]

3109

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

A

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019
## PE0140 (PE740) - විෂයමාලා න්‍යාය සහ භාවිතය

### II කොටස

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. විෂයමාලාව පිළිබඳ නිර්වචනය කර ගැනීම විෂයමාලා සැලසුම්කරණයට සාර්ථක මග පෙන්වීමකි.

(i) විෂයමාලා විද්වතුන් විසින් විෂයමාලාව පිළිබඳ ව ඉදිරිපත් කර ඇති නිර්වචන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ඔබ අධ්‍යයනය කර ඇති විෂයමාලාව පිළිබඳ නිර්වචන ඇසුරින් විෂයමාලාවක ඇතුළත් අංග ලක්ෂණ **පහක්** නම් කරන්න. (ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව සම්බන්ධයෙන් පවතින විවාදාත්මක මත **දෙකක්** සඳහන් කර, ඒවා කොතෙක් දුරට සාධාරණ දැ'යි හේතු සහිත ව විග්‍රහ කරන්න. (ලකුණු 07)

02. කිසියම් විෂයමාලාවක් පිළිබඳ තීරණ ගැනීමේ දී දාර්ශනික මත ඉතා වැදගත් වේ.

(i) අධ්‍යාපන දර්ශනයට මූලික වූ දාර්ශනිකයන් **හතර දෙනකු** නම් කරන්න. (ලකුණු 04)

(ii) ඔවුන්ගේ දාර්ශනික මත ආශ්‍රිත ව ගොඩනැගුණු අධ්‍යාපන දර්ශන **හතර** සඳහන් කරන්න. (ලකුණු 05)

(iii) වර්තමානයේ දී ශ්‍රී ලංකාවට වඩාත් උචිත වනු ඇතැ'යි ඔබ අදහස් කරන්නේ කුමන අධ්‍යාපන දර්ශනය මත පදනම් වූ විෂයමාලාවක් දැ'යි කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

03. විෂයමාලා සම්පාදනයේ දී මනෝවිද්‍යාත්මක සාධක කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කළ යුතු වේ.

(i) විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියට පදනම් සපයන මනෝවිද්‍යා ගුරුකුල **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) ඔබ කැමති මනෝවිද්‍යාත්මක ගුරුකුල **දෙකක** ඉගෙනුම පිළිබඳ විග්‍රහය සන්සන්දනය කරන්න. (ලකුණු 05)

(iii) ඉහත සඳහන් කළ එක් මනෝවිද්‍යාත්මක ගුරුකුලයක මූලික සංකල්ප තුනක් ශ්‍රී ලංකාවේ විෂයමාලා සැලසුම කෙරෙහි බලපා ඇති ආකාරය නිදසුන් **තුනක්** සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 07)

අ.පි.බ.



CamScanner

04. විෂයමාලාව සැලසුම් කිරීමේ දී සමාජ-ආර්ථික පසුතලය පිළිබඳ ව දැඩි ව අවධානය යොමු කළ යුතු ය. විෂයමාලාව සැලසුම් කිරීමේ දී සමාජ-ආර්ථික පසුතලය පිළිබඳ ව දැඩි ව අවධානය යොමු කළ යුතු ය.

(i) විෂයමාලාව කෙරෙහි බලපාන සමාජ-ආර්ථික පදනමෙහි අංශ **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) සමාජ සංවර්ධනය සඳහා දැනුම ලබා දීමේ මූලධර්ම **දෙකක්** සඳහන් කර, ඒවායේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) විශේෂ ලැදියා කණ්ඩායම් **දෙකක්** සඳහන් කර, ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව තුළ ඔවුන් සඳහා ලැබී ඇති ඉඩකඩ කෙතෙක් ද යන්න උදාහරණ **තුනක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 07)

05. විෂයමාලා පිරිසැලසුමක මූලිකාංග යම් විෂයමාලාවක ඇතුළත් වන ස්වභාවය අනුව විවිධ විෂයමාලා ප්‍රභේද දක්නට ලැබේ.

(i) විෂයමාලා පිරිසැලසුමක මූලිකාංග **හතර** ලියන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ විෂයමාලාව තුළ හඳුනා ගත හැකි විෂයමාලා ප්‍රභේද **දෙකක්** නම් කර, උදාහරණ **දෙකක්** මගින් සනාථ කරන්න. (ලකුණු 05)

(iii) ඔබ කැමති විෂයමාලා සංවර්ධන ආකෘතියක් රූපසටහනක් ඇසුරින් ඉදිරිපත් කර පැහැදිලි කරන්න. (ලකුණු 07)

06. මයිකල් ෆුලන්ට අනුව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම යනු වෙනස් කිරීමේ ක්‍රියාවලියකි.

(i) මයිකල් ෆුලන් දක්වා ඇති ආකාරයට විෂයමාලාව ක්‍රියාත්මකවීම කෙරෙහි බලපාන වෙනසෙහි ලක්ෂණ **හතර** නම් කරන්න. (ලකුණු 04)

(ii) විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ ආකෘති **දෙකක්** සඳහන් කර, ඉන් **එකක්** පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන වෙනස්වීමේ ක්‍රියාවලිය කෙරෙහි අධ්‍යාපන පරිවර්තන කාරකයන්ගේ දායකත්වය කොතෙක් දුරට බලපා ඇත්ද? විමසන්න. (ලකුණු 07)

07. විෂයමාලා ඇගයීම, විෂයමාලාවක වටිනාකම තීරණය කිරීම සඳහාත් විෂයමාලා සංවර්ධනය සඳහාත් අත්‍යවශ්‍ය ක්‍රියාවලියකි.

(i) විෂයමාලාව ඇගයීමේ ක්‍රියාවලිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) විෂයමාලා ඇගයීමේ ක්‍රියාවලියේ අවධි **දෙකක්** නම් කර, කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) විෂයමාලාව ඇගයීමේ ආකෘතියක් නම් කර, එහි සුවිශේෂී ලක්ෂණ **තුනක්** ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව කෙරෙහි අවධානය යොමු කරමින් පෙන්වා දෙන්න. (ලකුණු 07)

08. ශ්‍රී ලංකාවේ විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියට විවිධ පාර්ශ්වකරුවන් සුවිශේෂ දායකත්වයක් සපයයි.

(i) ශ්‍රී ලංකාවේ විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන පාර්ශ්ව **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) ඉන් එක් පාර්ශ්වයක දායකත්වය, පැවරී ඇති කාර්ය භාරයන් **තුනක්** ආශ්‍රිත ව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ප්‍රධාන විෂයමාලා ප්‍රතිසංස්කරණ **තුනක්** නම් කර, ඉන් **එකකින්** ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ප්‍රගමනයට ඇති කළ බලපෑම උදාහරණ **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 07)

********

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019
## PE0110 (PE710) - අධ්‍යාපන මනෝවිද්‍යාව

### II කොටස

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. අධ්‍යාපන මනෝවිද්‍යාව විෂය ක්ෂේත්‍රය යටතේ ඔබ මේ වන විට විවිධ පුද්ගල අධ්‍යයන ක්‍රම ඇතුළත් ව මනෝවිද්‍යාත්මක සංකල්ප රැසක් පිළිබඳ දැනුවත්භාවයක් ලබා තිබෙන අතර, ඒවා ගුරු භූමිකාව සඳහා අදාළ කර ගත හැකි ආකාරය පිළිබඳ ව අවධානය යොමු කිරීම බෙහෙවින් වැදගත් කාරණයකි.

   (i) අධ්‍යාපන මනෝවිද්‍යාව යනු කුමක් දැ'යි නිර්වචනය කර, එය පෝෂණය වීම සඳහා උපකාරී වූ වෙනත් මනෝවිද්‍යා උප ක්ෂේත්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 03)

   (ii) මනෝවිද්‍යාත්මක අධ්‍යයන ක්‍රමයක් වශයෙන් ප්‍රත්‍යෙක අධ්‍යයන ක්‍රමය කෙටියෙන් හඳුන්වා, එය ශිෂ්‍යයකු සම්බන්ධ ව තොරතුරු රැස් කිරීමට භාවිත කළ හැකි ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 05)

   (iii) ගුරුවරයකු වශයෙන් පාඩම් සැලසුම් සකස් කිරීමේ දී හා ඒවා ක්‍රියාවට නංවන විට දී අධ්‍යාපන මනෝවිද්‍යාත්මක සංකල්ප ඔබට ඉවහල් කර ගත හැකි අවස්ථා **හතරක්** උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 08)

02. ළමා සංවර්ධන ක්‍රියාවලිය පදනම් ව ළමා සංවර්ධන අවධි ව්‍යුහයක් නිර්මාණය කිරීමට විවිධ මනෝවිද්‍යාත්මක ප්‍රවේශ දායක වී ඇත.

   (i) නව යෞවන වියේ පසුවන ශිෂ්‍යයන් වෙතින් ප්‍රදර්ශනය වන ප්‍රධාන අවශ්‍යතා **තුනක්** ලියන්න. (ලකුණු 03)

   (ii) පුද්ගල සංවර්ධනය පිළිබඳ ව සිග්මන් ෆ්‍රොයිඩ් විසින් දක්වා තිබෙන මනෝලිංගික සංවර්ධන අවධි **පහ** නම් කර, ඒවා කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05)

   (iii) නව යෞවන වියේ පසුවන ශිෂ්‍යයන් සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** උදාහරණ සහිත ව විස්තර කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

03. ප්‍රජානන ඉගෙනුම් න්‍යාය කාණ්ඩයට අයත් වන ගෙස්ටෝල්ට් න්‍යායේ අන්තර්ගත මූලධර්ම පංති කාමර ඉගෙනුම් අවස්ථා සංවිධානයේ දී විශාල මගපෙන්වීමක් කරනු ලැබේ.

(i) චර්යාවාදී ඉගෙනුම් න්‍යායන්ට සාපේක්ෂ ව ප්‍රජානන ඉගෙනුම් න්‍යායන්ගේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03)

(ii) ගෙස්ටෝල්ට් න්‍යායවාදීන් ප්‍රකාශ කළ ආකාරයට සංජානනය කෙරෙහි බලපාන විෂය බද්ධ සාධක **පහක්** රූපසටහන් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iii) ගෙස්ටෝල්ට් ඉගෙනුම් න්‍යාය පිළිබඳ අවබෝධය පංති කාමර ඉගෙනුම් අවස්ථා සංවිධානයේ දී ඉවහල් කර ගත හැකි ආකාර **හතරක්** උචිත උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 08)

04. "ගුරු භූමිකාවට අදාළ ප්‍රධාන කාර්යයක් වශයෙන් ශිෂ්‍යයන් තුළ යහපත් පෞරුෂ ගුණාංග සංවර්ධනයට දායක වීම දැක්විය හැකි ය."

(i) පෞරුෂ සංකල්ප තුළ අන්තර්ගත සුවිශේෂී ගුණාංග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) සාර්ථක ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය කරන පෞරුෂ ගුණාංගයක් වන මෘදු කුසලතා (Soft Skills) යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? සෑම ශිෂ්ටසම්පන්න සමාජයකට ම පොදු වන මෘදු කුසලතා **හයක්** ලියා දක්වන්න. (ලකුණු 05)

(iii) පෞරුෂ සංවර්ධන න්‍යායයන් පිළිබඳ ව ඔබ ලබා ගත් අවබෝධය පදනම් ව ශිෂ්‍යයන් තුළ යහපත් පෞරුෂ ගුණාංග දියුණු කිරීම සඳහා ගුරුවරයකු වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** විස්තර කරන්න. (ලකුණු 08)

05. අධ්‍යාපන කටයුතු සඳහා ශිෂ්‍යයන් යොමු කරවන බලවේගයක් වශයෙන් අභිප්‍රේරණය හඳුන්වා දිය හැකි ය.

(i) අභිප්‍රේරණය පිළිබඳ ව මැක්ඩූගල්ගේ සහජ ලැදියා න්‍යාය මගින් හඳුන්වා දුන් සහජ ලැදියා **තුනක්** හඳුන්වන්න. (ලකුණු 03)

(ii) අභිප්‍රේරණ ක්‍රියාවලිය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක **දෙක** නම් කර, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) අභිප්‍රේරණය සම්බන්ධ ව ඉදිරිපත් ව පවතින න්‍යායන්ගේ අන්තර්ගත ප්‍රධාන මූලධර්ම ඉගෙනීම සඳහා ශිෂ්‍ය අභිප්‍රේරණය ඉහළ නැංවීමට ඉවහල් කර ගත හැකි අවස්ථා **හතරක්** දක්වා, ඒ ඔස්සේ ශිෂ්‍ය අභිප්‍රේරණය සිදුවන ආකාරය විස්තර කරන්න. (ලකුණු 08)

06. ශිෂ්‍ය ස්මෘතිය වැඩි දියුණු කිරීම සඳහා ස්මෘති ක්‍රියාවලියේ ස්වභාවය සහ ස්මෘති අවධි පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ගුරුවරයකු තුළ පැවතීම වැදගත් වේ.

(i) ස්මෘති ක්‍රියාවලියේ ප්‍රධාන අදියර **තුන** කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

(ii) ස්මෘති අවධි යටතට ගැනෙන කෙටිකාලීන ස්මෘතිය යන්න හඳුන්වා, එයට තොරතුරු ලැබෙන ප්‍රධාන ක්‍රම **තුන** නම් කරන්න. (ලකුණු 05)

(iii) ශිෂ්‍ය ස්මෘතිය වැඩි දියුණු කිරීම සඳහා ඉවහල් කර ගත හැකි ක්‍රම ශිල්ප **හතරක්** ඔබ උගන්වන විෂය ක්ෂේත්‍ර ආශ්‍රිත උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පි.බ.

07. "ළඟා කර ගත යුතු අවසාන ඉලක්ක තිබිය දී ඒවා ළඟා කර ගැනීමට සුදුසු ක්‍රම විද්‍යමාන නොවන විට ගැටලු පැන නගියි."

(i) ගැටලු විසඳීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක **තුනක්** හඳුන්වන්න. (ලකුණු 03)

(ii) ගැටලු විසඳීම සඳහා භාවිතයට ගැනෙන විද්‍යාත්මක ක්‍රමයේ ප්‍රධාන පියවර **පහ** නම් කර, ඒවා කෙටියෙන් පහදන්න. (ලකුණු 05)

(iii) ශිෂ්‍යයන් තුළ ගැටලු විසඳීමේ හැකියාව සංවර්ධනය කිරීම සම්බන්ධ ගුරු කාර්යභාරය කරුණු **හතරක්** ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 08)

08. පංති කාමර ඉගැන්වීම් කටයුතුවල දී සුහග හා විශිෂ්ට කුසලතා පෙන්වන ශිෂ්‍යයන් විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් වශයෙන් හඳුනා ගැනීම මෙන් ම ඔවුන් ඉදිරි පෝෂණයට ලක් කිරීම සෑම ගුරුවරයකුගේ ම වගකීමකි.

(i) "විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන්" නම් සංකල්පය අර්ථකථනය කර, විශේෂ අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණු ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) සුහග හා විශිෂ්ට කුසලතා දක්වන ශිෂ්‍යයන්ට පාසල එපා වීමට හෝ පාසල් අධ්‍යාපනය පිළිබඳ සෘණාත්මක සිතිවිලි පැන නැගීමට බලපෑ හැකි හේතු **පහක්** කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iii) ඔබේ පංති කාමරය තුළ ඉගෙනුම ලබන සුහග ශිෂ්‍යයන්ගේ හැකියා තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ඔබගේ විෂය ඉගැන්වීම් පරාසය තුළ අනුගමනය කළ හැකි ඉදිරි පෝෂණ ක්‍රියාමාර්ග **හතරක්** විස්තර කරන්න. (ලකුණු 08)

********



CamScanner